## නැණ සයුර - 02 ප්‍රශ්න පත්‍රය

### II පත්‍රය - පිළිතුරු

### I කොටස

1. (අ) (i) ලංකා සිතියමේ ස්ථාන 12 ක් ලකුණු කොට නම් කිරීම.
(ලකුණු 12 යි)

(ii) ලෝක සිතියමේ ස්ථාන 6 ක් ලකුණු කොට නම් කිරීම.
(ලකුණු 06 යි)

(ආ) (i)

A - ගුටෙන්බර්ග්
B - ඇළහැර
C - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
D - කෘෂි මැකලම්

(ලකුණු 04 යි)

(ii) 1. කතුරු කිහිපයක්
2. පොළොන්නරුවේ ආලාහන පිරිවෙන් සංකීර්ණයෙන්
3. ලෝහ
4. සැත්කම් සඳහා

(ලකුණු 04 යි)

(iii) 1. ජෙනී යන්ත්‍රය
2. ජේම්ස් හා ග්‍රීව්ස්
3. නූල් කැටීම සඳහා
4. පේශ කර්මාන්තයේ

(ලකුණු 04 යි)

### II කොටස

2. (i) * නමා වකුටු කොට මිනී වැළලීම.
* ඇටකටුවල ගුරුගල් ආලේප කිරීම.
* හිස්කබල දෙකට බෙදෙන සේ සිදුරු කිරීම.

(ලකුණු 1 x 3 = 3 යි)

(ii) * ගල් යුගය
* ලෝහ භාවිතා කල යුගය (ශාක ආහාර මත යැපුණු යුගය)

(එක් කරුණකට ලකුණු 2 බැගින් 2 x 2 = 4 යි)

(iii) * යකඩ ලෝහ භාවිතය
* කෘෂි කර්මාන්තය ඇරඹීම.
* ස්ථිර නිවාස ඉදි කිරීම.
* මැටි වළං තැනීම.
* විධිමත් සුසාන ක්‍රම භාවිතය

(ලකුණු 3 + 2 = 5 යි)

(iv) * විවිධ වෘත්තිකයන් විසූ ගම්මාන පැවතීම.
* වැව් කේන්ද්‍ර කොට ගත් ගම්මාන පැවතීම.
* වැටකින් ආරක්ෂිත / අනාරක්ෂිත ගම්මාන තිබීම.
* ගමක පවුල් කිහිපයක් සිටීම.
* ගමක ප්‍රධානීන් සිටීම.

(ලකුණු 3 + 3 = 6 යි)

3. (i) විජය රජු (ලකුණු 1 x 1 = 1 යි)

(ii) * ගමේ වැව් නඩත්තු කිරීම.
* ගමේ ආරවුල් විසඳීම.
* වැවේ ජලය බෙදා දීම.
* අවාහ විවාහ කර දීම.
* පාරවල් නඩත්තු කිරීම.

(ලකුණු 1 x 2 = 2 යි)

(iii)

a) * වීරත්ව
* දේවත්ව
* බෝධිසත්ත්ව
* චක්‍රවර්තී
* පර්වතරාජ

(ලකුණු 1 x 2 = 2 යි)

b) * පියාගෙන් පුතාට
* සහෝදරයගෙන් සහෝදරයට

(ලකුණු 1 x 2 = 2 යි)

(iv) * රාජ්‍ය තාන්ත්‍රික සබඳතා
* විවාහ සබඳතා
* ආගමික සබඳතා

(ලකුණු 3 + 2 = 5 යි)

(v) * යකඩ කර්මාන්තය
* පේශ කර්මාන්තය
* කුඹල් කර්මාන්තය
* තඹ කර්මාන්තය
* ඇත් දත් කර්මාන්තය
* පේශ කර්මාන්තය

(ලකුණු 3 + 3 = 6 යි)

4. (i) * මැටි ඔරු සුසාන ඉදි කිරීම.
* නිවාස ඉදි කිරීම.
* මැටි වළං නිපදවීම.

(ලකුණු 1 x 3 = 3 යි)

(ii)

A - සකපෝරුව
B - දියකැට පහන
C - අඩික
D - මජ්ජිම

(ලකුණු 1 x 4 = 4 යි)

(iii) * නීත්‍යානුකූල අයිතියක් නොමැති වීම.
* බුදු දහම නඟා සිටුවීම.
* ආර්ථිකය නඟා සිටුවීම.
* සීතාවකින් උඩරට බේරා ගැනීම.
* පෘතුගීසීන්ගෙන් උඩරට බේරා ගැනීම.

(ලකුණු 2 + 3 = 5 යි)

(iv) * ග්‍රාමීය සමාජයක් පැවතීම.
* අවාහ විවාහ කුලය අනුව සිදු වීම.
* පවුලට සමාජයේ වැදගත්කමක් ලැබීම.
* ගුණගරුක සමාජයක් පැවතීම.
* රජු විසින් ඉඩම් ජනතාවට බෙදා දීම.

(ලකුණු 6 යි)

5. (i) * ජෝන් වයික්ලිප්
* ජෝහැන්සස්
* ඉරාමස
* මාටින් ලූතර්

(ලකුණු 1 x 3 = 3 යි)

(ii) * ලෞකිකත්වයට බර චිත්‍ර ඇඳීම.
* අඩනිරුවත් චිත්‍ර ඇඳීම.
* නිරුවත් රූප ඇඳීම.
* ධනවත් පවුල් වල අය චිත්‍රයට නැගීම.
* ස්වභාවිකත්වයට මුල් තැන දීම

(ලකුණු 2 x 2 = 4 යි)

(iii) * කොන්ස්තන්තිනෝපලය තුර්කීන් සතුවීම.
* වෙළදාම දියුණු වීම.
* ධනවතුන් බිහිවීම.
* බුද්ධි ප්‍රබෝදය
* පල්ලියේ ආධිපත්‍ය විවේචනය කිරීම.

(ලකුණු 3 + 2 = 5 යි)

(iv) * වෙළදාම දියුණු වීම.
* බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම.
* මුදල් භාවිතය
* චෙක්පත් මගින් ගණුදෙණු කිරීම.
* බැංකු ආරම්භ කිරීම.
* බැංකු ණය ලබා දීම.

(ලකුණු 3 + 3 = 6 යි)

6. (i) * බෙංගාල බොක්කට මුහුණලා තිබීම.
* ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ නාවික බලය රැක ගැනීමට ත්‍රිකුණාමලය වැදගත් වීම.
* අධික වර්ෂා කාල වල විශාල නැව් ප්‍රමාණයක් නවතා තැබිය හැකි වීම.

(ලකුණු 1 x 3 = 3 යි)

(ii) * බදු එකතු කිරීමට දේශීය නිලධාරීන් පත් කිරීම.
* පොල් ගස් ඇතුළු නව බදු ඉවත් කිරීම.
* ආදායම් එකතු කිරීමට වෙනම නිළධාරීන් පත් කිරීම.
* ලන්දේසි උසාවි පිහිටුවීම.

(ලකුණු 2 x 2 = 4 යි)

(iii) * පිරිවෙන් පිහිටු වීම.
* වාද විවාද පැවැත්වීම.
* මුද්‍රණාල ආරම්භ කිරීම.
* බෞද්ධ පාසල් ඇරඹීම.
* බෞද්ධ පුවත්පත් එළි දැක්වීම.

(ලකුණු 3 + 2 = 5 යි)

(iv) * උදයභාණු පුවත්පත ඇරඹීම.
* පෙරියපුරාණම්, ස්කණ්ධ පුරාණම් ග්‍රන්ථ රචනා කිරීම.
* වන්නපොනෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය පිහිටවීම.
* ශෛව පරිපාලන සභාව පිහිටවීම.
* හින්දු විද්‍යාලය/ශිවන්ගල විද්‍යාලය පිහිටවීම.

(ලකුණු 6 යි)

7. (i)

A - 1833 කෝල්බෲක්

B - පොන්නම්බලම් රාමනාදන්

C - 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

(ලකුණු 1 x 3 = 3 යි)

(ii)

a) * ඉංග්‍රීසි භාෂාව ලැබීම.
* සන්නිවේදන කටයුතු දියුණු වීම.
* අපනයන වැවිලි බෝග හඳුන්වා දීම.
* කාර්මික විප්ලවයේ බලපෑම.
* පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලැබීම.

(ලකුණු 1 x 2 = 2 යි)

b) * බටහිර සංස්කෘතික අංග මෙරට ඇතිවීම.
* මද්‍යසාර භාවිතය
* ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම.
* ස්වයං පෝෂිත ආර්ථිකය බිඳවැටීම.
* ගම් සභාව ඉවත්වීම.

(ලකුණු 1 x 2 = 2 යි)

(iii) * මූලික අයිතිවාසිකම්
* ජාතික රාජ්‍ය සභාව
* අගමැති හා අමාත්‍ය මණ්ඩලය
* අධිකරණ පද්ධතිය
* ජනාධිපති

(ලකුණු 2 + 3 = 5 යි)

(iv) * පාසල්/විශ්වවිද්‍යාල පිහිටුවීම.
* විෂය මාලා සංවර්ධනය කිරීම.
* ගුරු පුහුණු කටයුතු සිදු කිරීම.
* පුස්තකාල ආරම්භ කිරීම.
* විද්‍යාගාර බිහි කිරීම.
* දිවා ආහාර, පොත් නිල ඇඳුම් ලබාදීම.

(ලකුණු 3 + 3 = 6 යි)

## III කොටස

8. (i) * කොන්ස්තාන්තිනෝපලයේ සිට මධ්‍ය ආසියාව හරහා චීනයට
* කොන්ස්තාන්තිනෝපලයේ සිට මධ්‍යදරණී මුහුද ඔස්සේ ඉන්දියාවට
* කොන්ස්තාන්තිනෝපලයේ සිට පර්සියන් බොක්ක හරහා ඉන්දියාවට

(ලකුණු 1 x 3 = 3 යි)

(ii) * පෘතුගීසීන් නෙරපීමට උඩරට රජු සහය දීම.
* ලන්දේසීන්ට වැයවන මුදල් වෙළඳ ද්‍රව්‍ය මගින් ගෙවීම.
* ඇතුන් හැර සෙසු වෙළඳ ද්‍රව්‍ය ලබා දීම.
* රජු කැමතිනම් පෘතුගීසීන්ගේ බල කොටුවල නතර වීමට අවසර ලැබීම.

(ලකුණු 2 x 2 = 4 යි)

(iii) * ලන්දේසී සමාගමට පාඩු සිදුවන ගැටුම්වලින් වැළකීම.
* උඩරට රජුගේ හිත දිනා ගැනීමට තෑගි බෝග දීම.
* උපසම්පදාව රැගෙන ඒම (ආගමික කටයුතු වලට සහයදීම.)

(ලකුණු 2 + 3 = 5 යි)

(iv) * 1594 දන්තුරේ සටන දියත් කිරීම.
* 1602 බලන සටන දියත් කිරීම.
* 1630 ඌව රන්දෙණිවල සටන දියත් කිරීම.
* 1638 ගන්නෝරුව සටන දියත් කිරීම.

(ලකුණු 3 + 3 = 6 යි)

9. (i) A - බිස්මාක්

B - දෙවන විලියම් රජු

C - ඇඩොල්ෆ් හිට්ලර්

(ලකුණු 1 x 3 = 3 යි)

(ii) * රටවල් අතර භේද විසඳීමට.
* අනාගත ලෝක යුද්ධ වැළැක්වීමට
* ජාත්‍යන්තර සහයෝග දිනා ගැනීමට.
* කුඩා රටවල නිදහස රැකීමට.
* ලෝක සාමූහිකත්වය රැකීමට.

(ලකුණු 2 x 2 = 4 යි)

(iii) * ඇමරිකාව ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම.
* ජාතීන්ගේ සංගමය ගනු ලබන තීරණ වලට පොදු එකඟතාවක් නොමැති වීම.
* ජාතීන්ගේ සංගමයේ සාමාජික රටවල් අතර අසමගියක් නොවීම.
* ජපානය, මැංචූරියාව ආක්‍රමණය කල විට ජපානයට කිසිදු රටක් එරෙහි නොවීම.


(ලකුණු 2 + 3 = 5 යි)

(iv) * සූවස් අර්බුදය විසඳීම
* ගල්ෆ් අර්බුදය විසඳීම
* කියුබානු මිසයිල අර්බුදය විසඳීම

(ලකුණු 3 + 3 = 6 යි)

***

විභාග අංකය : ..................................



විභාග අංකය : .......................................

